ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82

දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා
නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2567 2024 ජුලි 20 ඇසළ කලාපය

**දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී
කොළඹ නාලාන්දා මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය
ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය ලේල්වල සමිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# සත්‍යය සොයා ගිය ගමන

**“ කිච්ඡේන මෙ අධිගතං - හලං දානි පකාසිතුං
රාග දෝස පරේතේහි - නායං ධම්මෝ සුසම්බුධෝ
පටිසෝතගාමිං නිපුණං - ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති - තමොක්ඛන්ධේන ආවටා”**

**(මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, බෝධිරාජ කුමාර සූත්‍රය)**

සුපින්වතුනි,

ඇසළ පොහොය බෞද්ධයන්ට සුවිශේෂී දිනයකි. බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම, රාහුල කුමරුගේ උපත, මහාභිනිෂ්ක්‍රමණය, මංගල ධර්ම දේශනාව පැවැත්වීම, කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් වීම, මාතෘ දිව්‍යරාජයාට ධර්මය දේශනා කිරීම, භික්ෂූන් වහන්සේලා පෙරවස් විසීම, ලක්දිව ප්‍රථම භික්ෂු පිරිස ඇතිවීම, පාත්‍රාධාතුව ලක්දිවට වැඩම කරවීම, සියම් රටින් උපාලි තෙරුන් ප්‍රධාන භික්ෂූන් මෙරට මහණ උපසම්පදාව යළි පිහිටුවීම යන වැදගත් කරුණු සිදුවූයේ ඇසළ පොහොය දිනකය.

බුදුබව ලැබීම පිණිස සිදුහත් බෝසතුන් ගත් අප්‍රමාණ වෙහෙස ගැන මෙවන් දිනෙක සිහිකිරීම සුදුසුමය. අරියපරියේසන, මහාසච්චක වැනි සූත්‍රවල

බුදුමුවින්ම ඒ ගැන වදාළ තොරතුරු ඇත. බෝධිරාජකුමාර සූත්‍රය ද එවැන්නකි.

බුදුන් වහන්සේ භග්‍ග රට, සුංසුමාරගිරි නුවර, භෙසකලා වනයෙහි වැඩවසද්දී තමාගේ අලුත්ම කෝකනද ප්‍රාසාදය පළමුව බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා ලවා පරිභෝග කරවීමට සිතූ බෝධිරාජකුමාරයා සඤ්ජිකාපුත්ත මාණවයා යවා බුදුරදුන්ට ආරාධනා කරවා දොරටුවෙහි සුදු පියවිල්ලක් අතුරා තැබුවේ තමාට දරු සම්පත් තිබේනම් බුදුරජාණන්වහන්සේ ඒ මතින් වඩීවායි සිතාගෙනය. දනට වැඩි බුදුරදුන් පාවාඩය නොපාගා ආනන්ද තෙරුන්ගේ මුහුණ බැලූහ. ආනන්ද තෙරණුවෝ බුදුරදුන්ගේ අදහස දැන පියවිලි ඉවත් කරවූහ. පූර්ව කර්ම විපාකයක් නිසා රාජකුමාරයාගේ පැතුම ඉටු නොවන බැවින් බුදුහු ඒ මතින් නොවැඩියහ. දන් පිරිනමා අවසන බෝධිරාජකුමාරයා මිටි අසුනක් ගෙන එකත් පසෙක හිඳ මෙසේ කීය.

"ස්වාමීනි සැපයෙන් සැපය ලද නොහැක. සැප ලැබීමට දුක් විඳිය යුතුයැයි මට සිතේ." එවිට බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළහ. "රාජකුමාරය, බුදුවීමට පෙර මා සිතුවේද එසේය. නිවන සොයාගෙන ආළාරකාලාම, උද්දක රාමපුත්ත වෙත ගිය ද මට නිවන නොලැබුණි. මම එහි කලකිරී කුසලය කුමක්දැයි සොයමින් මගධ රට උරුවෙල් දනව්වෙහි සේනානි ගමට පැමිණියෙමි. එහි සිත්කලු බිම් කඩක් දුටු මට මෙසේ සිත් විය, මේ ප්‍රදේශය රමණීයයි. වන ලැහැබ සිත් අලවයි. සුදු වැලිතලා ඇති ඔය ඒ අසලින් ගලයි. සොඳුරු ගමත් ළඟම තිබේ. ප්‍රධාන වීර්ය වැඩීමට මෙය සුදුසුම තැනයයි සලකා මම එහිම හිඳ ගත්තෙමි. එවිට මින් පෙර නොවැටහුණු උපමා තුනක් මට වැටහිණි.

1. දියෙහි වැටුණු, අමු ලීයකින් ගිනි නිපදවීමට නොහැක්කාසේ කාමවස්තු පරිභෝග කරන (වස්තුකාමය), සිතෙහි කාමය දුරුනොකළ තැනැත්තාට අනුත්තර සම්බෝධිය ලද නොහැකිය.
2. ගොඩ තිබෙන එහෙත් අමු ලීයකින් ද ගිනි නිපදවිය නොහැකිය. එමෙන් කාම වස්තු පරිහරණය නොකළත්, ක්ලේශ කාමය සිතේ ඇති අයට අනුත්තර සම්බෝධිය ලද නොහැකිය.
3. ගොඩ තිබෙන, වියළි ලී කැබැල්ලක් ගිනිගානා දණ්ඩෙන් පිරිමැද ගිනි නිපදවිය හැක්කාසේ කයිනුත්, සිතිනුත් කාමයන් අත්හළ කෙනාට දැඩිව උත්සාහ කරන විට අනුත්තර සම්බෝධිය ලද හැකිය,

රාජකුමාරය, ඒ අනුව මම දත් තදකරගෙන කෙලෙස් තැවීමට වීර්යය කළෙමි. එවිට බලවත් පුරුෂයෙක් දුර්වල පුරුෂයෙකු හිසෙන් හා ගෙලෙන් ගෙන පීඩාවට පත් කරන විට මෙන් මගේ සිරුරින් අධික ලෙස දහඩිය ගලන්නට විය. රාජකුමාරය ඊළඟට මම අප්‍රාණක ධ්‍යානය කරමියි සිතා මුඛයෙනුත්, නාසයෙනුත් අශ්වාස ප්‍රාශ්වාස නැවැත්වීමි. එවිට මයින හමකින් පිටවන වාතය මෙන් අධික ශබ්දය ඇතිව මගේ දෙකන් සිදුරුවලින් වාතය පිට විය. රාජපුත්‍රය, අනතුරුව මම මුඛය, නාසය, කන්සිදුරු වසා ගත්තෙමි. එවිට බලවත් පුරුෂයෙක් ශක්තිමත් කඹයකින් හිස තදින් වෙලන්නා සේ ද, තියුණු කඩු තුඩකින් අනින්නා සේ ද, මගේ හිසේ දැඩි වේදනා

ඇතිවිය. අනතුරුව එම වාතය කුසට වැදී මස් කපන පිහියකින් කුස කපන්නාක් මෙන් දැනුණි. බලවත් පුරුෂයන් දෙදෙනෙක් දුර්වල පුද්ගලයෙකු අල්ලා ගිනි අඟුරු වලකට දමන විටෙක මෙන් මගේ සිරුරේ දැවිල්ලක් ඇතිවිය.

රාජපුත්‍රය, ඉන්පසු මම දිනකට ආහාර ලෙස ධාන්‍ය තැම්බූ යුෂ පතක් පමණ ගෙන භාවනා කළෙමි. එවිට මගේ තට්ටම්වල මස් දිය විය. දිරූ ගෙයක පරාලමෙන් ඉළ ඇට පෙනෙන්ට විය. ඇස් යටට ගිලුණි. හිසේ සම හැකිළුණි. බඩ ඇල්ලූ විට කොඳු ඇටය හසුවන තරමටම සිරුර කෘෂවිය. අතපය පිරිමදින විට කුණු වූ මුල් ඇති ලෝම ගිලිහුණි. මෙසේ මීට පෙර කිසිවෙකු විසින් වත් නොකළ තරමට උග්‍ර තපස් කළත් මට ඥානදර්ශනය පහළ නොවීය.

මෙතෙක් කළ උග්‍ර තපසින් ප්‍රයෝජනය නැති නිසා ඥානදර්ශනය පහළකර ගැනීම සඳහා අන් මගක් සෙවීමට කල්පනා කළ මම ඒ සඳහා කය ශක්තිමත් කර ගත යුතු බැවින් රළු ආහාර ගැනීමට යොමු වූණෙමි. මගේ ධෛර්යය පිරිහී ඇතැයි සිතූ පස්වග තවුසෝ මා හැර ගියහ. ආහාරයෙන් කය ප්‍රකෘතිමත් කරගත් මම සතර ධ්‍යානයන් යළි උපදවා ගතිමි. එමගින් සිත සමාහිත වී, කෙලෙස් යටපත් වී, බබලන තත්ත්වයට පත් වූ විට පෙර භාවයන් සිහිකිරීමේ නුවණ (පුබ්බේ නිවාසානුස්සති ඥාණය) ලැබීම සඳහා සිත යොමු කොට රාත්‍රී පළමු යාමෙහි එම නුවණ ලබාගතිමි.

ඉන් පසු සත්ත්වයන්ගේ චුති උප්පත්ති දක්නා නුවණ (චුතූපපාත ඥාණය) ලැබීමට සිත නැඹුරු කොට රාත්‍රී දෙවන යාමෙහි එය ලබාගතිමි. මෙසේ තව දුරටත් සිත සංවර වූ විට පිරිසිදු වූ විට ආශ්‍රවයන් ක්ෂය කිරීමේ නුවණ (ආසවක්ඛය ඥාණය) සඳහා සිත මෙහෙයවා රාත්‍රී අලුයම දී චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කළෙමි. එවිට මගේ සිත ආශ්‍රවයන්ගෙන් මිදුණි. මිදුණු විට ඒ බව දැනගතිමි. මගේ නැවත නැවත ඉපදීම (ජාතිය) ක්ෂය විය. නිවන් සඳහා සියල්ල කරන ලදී. මත්තෙහි කළයුත්තක් නැත.අවිද්‍යාව දුරු වී විද්‍යාව පහල විය.

“කිච්ඡේන මේ අධිගතං.......” මා දුකසේ අවබෝධ කරගත් පටිච්චසමුප්පාද ධර්මය, තෘෂ්ණාවෙහි ඇලී ගැලී සිටින සත්ත්වයන්ට අවබෝධ කර ගැනීම අපහසුය. අන් අයට මෙය තේරුම් ගත නොහැකි නම්, එය දේශනා කිරීමෙන් සිදුවන්නේ මා වෙහෙසට පත් වීම පමණි. රාග දෝස දෙකින් යුක්ත වුවන්ට පටිසෝතගාමී වූ, සියුම් වූ, ගැඹුරු වූ, දැකීමට අපහසු වූ, ඉතාමත් සියුම් වූ මේ ධර්මය අවබෝධ කළ නොහැකියයි ධර්ම දේශනා කිරීමට මගේ සිත නොනැමුණි. ඉක්බිති සහම්පති මහා බ්‍රහ්මයා පැමිණ, දහම් අවබෝධ කළ හැකි අය සිටින හෙයින් දහම් දෙසන ලෙස මට ආරාධනා කළේය. රාජකුමාරය,ඉන් පසු මම සත්ත්වයන් කෙරෙහි කරුණාවෙන්, බුදු ඇසින් ලොව දෙස බැලුවෙමි. එවිට කෙලෙස් අඩු, කෙලෙස් වැඩි,සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්මයන් දියුණු වූ, මෘදු වූ, සුවසේ අවබෝධ කරවිය හැකි, පරලොව ගැන, වරද ගැන බිය වන ස්වභාවයෙන් යුත් සත්වයන් දුටුවෙමි.

පළමුව දහම් දෙසීම සඳහා ආළාර කාලාම,සහ උද්දක රාමපුත්ත දෙදෙනා

ගැන සිතුවත් ඔවුන් මිය පරලොව ගොස් සිටි නිසා ප්‍රධාන වීර්ය වඩන සමයෙහි මට බොහෝ උපකාරවත්ව සිටි පස්වග මහණුන් සොයා යාමට පිටත් වුණෙමි. බරණැස ඉසිපතනාරාමයට ගිය මට පස්වග මහණෝ පෙර මෙන් සත්කාර සම්මාන නොකළහ.ඔවුහු මට සිද්ධාර්ථ යන නමින්ද, ඇවැත්නි යනුවෙන් ද සමානාය කෙනෙකුට මෙන් කථා කළහ.

තථාගතයන්ට නම කියා හෝ "ආවුසෝ" කියා හෝ ආමන්ත්‍රණය නොකළයුතු බවත්, දැන් සත්‍යය අවබෝධ කරගෙන සිටින බවත් පැහැදිලි කර දුන්නද ඔවුහු නොපිළිගත්හ. මීට පෙර 'සත්‍ය අවබෝධ කළෙමි'යි නොකීවේ ඒ වන විට සත්‍යා වබෝධ නොකර සිටි නිසා බවත්, දැන් සත්‍ය අවබෝධ කරගෙන සිටින බවත් පවසා ඔවුන් දහම් ඇසීම පිණිස යොමු කර ගතිමි. කිහිප දිනකින් ඒ පස් දෙනාම ධර්මය අවබෝධ කොට රහත් ඵලයට පත්වූහ.